# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1780/14 - 2012 ඔක්තෝබර් 16 වැනි අඟහරුවාදා - 2012.10.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස — ඉඩම්

## ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම්

*ව්‍යවස්ථාපිත නිශ්චය අංකය* : 4630.
*විශේෂ අංකය* : ර/84.

**1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 19 වැනි වගන්තිය යටතේ ව්‍යාවස්ථාපිත නිශ්චය**

බලංගොඩ, සාන්ත මයිකල්ස් හි පදිංචි ඉලේකුට්ටිගේ ඇලෝසියුස් ලුවිස් ප්‍රනාන්දු මහතා විසින් පනතේ 18 වැනි වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත ප්‍රකාශයක් කරන ලදින් මේ වන විට ඔහු මියගොස් ඇති බැවින්, පනතේ 19 වැනි වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල අනුව එම කොමිෂන් සභාව විසින් ව්‍යවස්ථාපිත බදු ගැනුම්කරුට අයිතිව තිබූ කෘෂිකාර්මික ඉඩම් වලින් ඔහුට තබා ගැනීමට ඉඩදිය යුතු කොටස නිශ්චය කරමින් ඔහුගේ බූදලය සම්බන්ධයෙන් පානදුර දිසා අධිකරණ නඩු අංක 31/ටී දරන බූදල් නඩුවට බැර කිරීම සඳහා ව්‍යාවස්ථාපිත නිශ්චයක් කරන ලදී. එසේ ව්‍යවස්ථාපිත බදු ගැනුම්කරුට තබා ගැනීමට ඉඩ දෙන ලද කෘෂිකාර්මික ඉඩම් කොටස් මෙහි පහත උපලේඛණයෙහි දැක්වේ.

අධිනීතිඥ නිමල් ජී. පුංචිහේවා,
සභාපති,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

අංක සී 82,
හෙක්ටර් කොබ්බෑකඩුව මාවත,
කොළඹ 07,
2012.

*උපලේඛනය*

01. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ, හෙලඋඩ පළාත සුළු කොට්ඨාසයේ, කිරිමැටිතැන්න ගමෙහි පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද අවසාන ගම් පිඹුරු අංක 289 අතිරේක අංක 2හි දැක්වෙන කොඩිතුවක්කු කුඹුර නමැති ඉඩමේ කැබලි අංක 101 දරන බිම් කැබැල්ලෙන් නොබෙදූ අක්කර 00, රූඩ් 02, පර්චස් 16 ප්‍රමාණ ඇති බිම් කොටස සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු ද,

1A - G 16753 — 335 (201210)

02. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, බලංගොඩ නගර සභා සීමාව තුළ අංක 5 දරන දෙහිගස්තලාව කොට්ඨාසය සුළු කොට්ඨාශයේ, දෙහිගස්තලාව ගමෙහි පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද අවසාන ගම් පිඹුරු අංක 287 අතිරේක අංක 4හි දැක්වෙන මස්වැන්නෙයිහේන නමැති ඉඩමේ අක්කර 01, රූඩ් 1, පර්චස් 15 ප්‍රමාණය ඇති කැබලි අංක 75 දරන බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු හා ගොඩනැගිලි ද,

03. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, හෙලඋඩ පළාත සුළු කොට්ඨාසයේ, දෙහිගස්තලාව ගමෙහි පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද අවසාන ගම් පිඹුරු අංක 287 අතිරේක අංක 5හි දැක්වෙන දෙහිගස්තලාවේවෙල මොරගහඅරාවේදරාව සහ දෙහිගස්තලාවේවෙල මඩිත්තේ කුඹුර පල්ලෙහාකැල්ල නමැති කුඹුරු ඉඩම් වල අක්කර 01, රූඩ් 00, පර්චස් 36 ප්‍රමාණ ඇති කැබලි අංක 76, 77 දරන බිම් කැබලි සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු ද,

04. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, හෙලඋඩ පළාත සුළු කොට්ඨාසයේ, දෙහිගස්තලාව ගමෙහි පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද අවසාන ගම් පිඹුරු අංක 287 අතිරේක අංක 5හි දැක්වෙන දෙහිගස්තලාවේවෙල මඩිත්තේ කුඹුර (උඩහකැල්ල) නමැති කුඹුරු ඉඩමේ අක්කර 00, රූඩ් 01, පර්චස් 19 ප්‍රමාණ ඇති කැබලි අංක 78 දරන බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු ද,

05. ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ මහ පළාත කෝරලය සුළු කොට්ඨාසයේ මැටිපිඹිය ගමෙහි පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද අවසාන ගම් පිඹුරු අංක 116හි දැක්වෙන ගිනිගත්ගලපතන උඩආරාවේපතන නමැති ඉඩමේ අක්කර 02, රූඩ් 00, පර්චස් 21 ප්‍රමාණ ඇති කැබලි අංක 291 දරන බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු හා ගොඩනැගිලි ද,

06. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුන (දකුණ) ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, ආඩිගොඩ ගමෙහි නල්ලහේන කොට්ඨාසයේ අංක 05 (බේරුවල නගර සභා සීමාව තුළ) පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද මූලික පිඹුරු අංක ක 1127 හි දැක්වෙන මද්දාවෙල නමැති කුඹුරු ඉඩමේ අක්කර 00, රූඩ් 03, පර්චස් 22.4 ප්‍රමාණ ඇති කැබලි අංක 1 දරන බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු ද,

07. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, හෙලඋඩ පළාත සුළු කොට්ඨාසයේ, ආදාදොළ ගමෙහි පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද අවසාන ගම් පිඹුරු අංක 259 අතිරේක අංක 1හි දැක්වෙන ටිල්බරිය වත්ත නමැති ඉඩමේ අක්කර 05, රූඩ් 01, පර්චස් 15.1 ප්‍රමාණ ඇති කැබලි අංක 68 දරන බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු හා ගොඩනැගිලි ද,

08. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, බලන්ගොඩ නගර සභා සීමාව තුළ කොට්ඨාශ අංක 2 කොටුගොඩැල්ල ගමෙහි පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද මූලික පිඹුරු අංක ර 57හි දැක්වෙන කරව්කැටිය වත්ත, කරවාකැටිය වත්ත වරිපනම් අංක 112 පරණ පාර නමැති ඉඩමේ අක්කර 01, රූඩ් 01, පර්චස් 06 ප්‍රමාණ ඇති කැබලි අංක 01 දරන බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු හා ගොඩනැගිලි ද,

09. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, බලංගොඩ නගර සභා සීමාව තුළ කොට්ඨාස අංක 05 තුඹගොඩ සුළු කොට්ඨාසයේ තුඹගොඩ (කොටස) ගමෙහි පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද මූලික පිඹුරු අංක ර53 හි දැක්වෙන කරන්දගහ කුඹුරේ දරුන්ඩ කැල්ල මෙට්නෝල් පාරේ වරිපනම් අංක 51/5 නමැති කුඹුරු ඉඩමේ අක්කර 01, රූඩ් 00, පර්චස් 04 ප්‍රමාණ ඇති කැබලි අංක 1 දරන බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු ද,

10. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, හෙළ උඩ පළාත සුළු කොට්ඨාසයේ තොටුපොළතැන්න ගමෙහි පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද අවසාන ගම් පිඹුරු අංක 286 අතිරේක 1හි දැක්වෙන ලිඳගාව කුඹුර පිල්ලේ අරාව නමැති කුඹුරු ඉඩමේ අක්කර 00, රූඩ් 00, පර්චස් 20 ප්‍රමාණ ඇති කැබලි අංක 52 දරන බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු ද,

11. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, හෙළ උඩ පළාත සුළු කොට්ඨාසයේ තොටුපොළතැන්න ගමෙහි පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද අවසාන ගම් පිඹුරු අංක 286 අතිරේක අංක 2හි දැක්වෙන යකහළුතැන්න, කට්ටාඩි කුඹුර නමැති කුඹුරු ඉඩමේ අක්කර 00, රූඩ් 03, පර්චස් 13 ප්‍රමාණ ඇති කැබලි අංක 53 දරන බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු ද,

12. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, හෙළ උඩ පළාත සුළු කොට්ඨාසයේ දාමහන ගමෙහි පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද අවසාන ගම් පිඹුරු අංක 304 අතිරේක අංක 4හි දැක්වෙන ගනිටන් ඕවිට නමැති කුඹුරු ඉඩමේ අක්කර 00, රූඩ් 01, පර්චස් 32 ප්‍රමාණ ඇති කැබලි අංක 177 දරන බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු ද,

13. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, බලන්ගොඩ නගර සභා සීමාව ඇතුළත කොට්ඨාස අංක 3 බලගහමුල සුළු කොට්ඨාසයේ වතුකාරගොඩ (කොටසක්) ගමෙහි පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද අවසාන ගම් පිඹුරු අංක 477 අතිරේක අංක 7හි දැක්වෙන තානායම් ගෙදරගාව අරාව වරිපනම් අංක 12/120 පෙට්ටිගල පාරේ නැමැති කුඹුරු ඉඩමේ අක්කර 00, රූඩ් 02, පර්චස් 37 ප්‍රමාණ ඇති කැබලි අංක 207 දරන බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු ද,

14. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බටහිර පස්දුන් කෝරළය ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ ඉද්දගොඩ පත්තුව සුළු කොට්ඨාසයේ ඉඳිගස් තුඩුව ගමෙහි පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද මූලික පිඹුරු අංක ක 1108හි දැක්වෙන මීගම වත්ත නමැති ඉඩමේ අක්කර 30, රූඩ් 03, පර්චස් 21 ප්‍රමාණ ඇති කැබලි අංක 1 දරන බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු හා ගොඩනැගිලි ද,

15. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ඉඹුල්පේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, තල්පිටිගම් පත්තුව සුළු කොට්ඨාසයේ යක්දෙහිවල (කොටසක) ගමෙහි පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද අවසාන ගම් පිඹුරු අංක 643 අතිරේක අංක 3හි දැක්වෙන දඹගහ කුඹුර දරාඬ කැල්ල ගනේ කුඹුර සහ ගනේ කුඹුර පදිපොල දරාඬ කැල්ල නමැති කුඹුරු ඉඩම්වල අක්කර 01, රූඩ් 00, පර්චස් 02 ප්‍රමාණ ඇති කැබලි අංක 142, 143 දරන බිම් කැබැලි සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු ද,

16. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ඉඹුල්පෙ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, උඩුවාගම් පත්තු සුළු කොට්ඨාසයේ අළුත්නුවර ගමෙහි පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද අවසාන ගම් පිඹුරු අංක 437 අතිරේක අංක 8හි දැක්වෙන හල්ගහදිගන නමැති කුඹුරු ඉඩමේ කැබලි අංක 199 දරන බිම් කැබැල්ලෙන් නොබෙදූ අක්කර 00, රූඩ් 02, පර්චස් 15 ප්‍රමාණ ඇති බිම් කොටස සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු ද වේ.

11-103

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.